# <u>උපදෙස් පත්‍රිකාව</u>

මාර්ගස්ථ ක්‍රමය යටතේ පමණක් පොලිස් නිශ්කාසන අයදුම්පත් යොමු කල යුතු අතර ඒ සඳහා මාර්ගස්ථ නිශ්කාසන සහතික අයදුම් කිරීමට ( www.police.gov.lk) වෙබ් අඩවියට පිවිස නිශ්කාසන අයදුම්පත යොමු කිරීමේ හැකියාව ඇත. ඒ සඳහා මුදල් ගෙවීම Credit card මඟින් හා Debit card මඟින් මාර්ගගත ක්‍රමයට සිදු කල හැකිය.

අයදුම්පත සම්පූර්ණ කිරිමට පෙර පහත ලේඛණවල (document) පරිලෝකන (scan) පිටපත් (250kb වඩා අඩු PDF Format) වෙන් වෙන් වශයෙන් සූදානම්කර තබාගැනීම අත්‍යවශ්‍ය වේ.

- විදේශ ගමන් බලපත්‍රයේ ජීව දත්ත ඇතුලත් පිටුව
- විදේශ ගමන් බලපත්‍රයේ සියලුම රටවල් (All countries) පිටුව
- විදේශ ගමන් බලපත්‍රයේ යම් වෙනස් කිරිමක් කර ඇත්නම් වෙනස් කිරිම් හා නිරීක්ෂණ (Alterations And Observations) පිටුව
- ජාතික හැදුනුම්පතේ ඉදිරිපස
- ජාතික හැදුනුම්පතේ පිටුපස
- උප්පැන්න සහතිකයේ ඉදිරිපස
- උප්පැන්න සහතිකයේ පිටුපස
- ඔබගේ ජාතික හැදුනුම්පතේ සඳහන් නම සහ විදේශ ගමන් බලපත්‍රයේ සඳහන් නම අතර වෙනසක් තිබේ නම් පමණක් ඒ බව සඳහන් කරමින් ලබාගත් දිව්රුම් ප්‍රකාශයක්.


**සැලකිය යුතට වඩා අඩු කාලයක් තුලදී 20 සිට විනාඩි අයදුම්පත පිරිවීමට පටන්ගත් මෙහොතේ - අයදුම්පත සම්පූර්ණ කර Payment එක සිදුකර අවසන් කල යුතුය.**

**NEW Application යටතේ අයදුම්පතක් යොමු කල පසු සහතිකපත නිකුත් කිරීමට අයදුම්පත යොමු කල දින සිට වැඩ කරන දින 14 ගත වේ.**

සැලකිය යුතුයි :-

- පොලිස් නිෂ්කාශන සහතිකයක් අයදුම් කිරිමට වයස අවුරුදු 16 වැඩි ශ්‍රී ලාංකිකයෙකු ජාතික හැදුනුම්පතේ පැහැදිලි පිටපතක් අයදුම්පතට ඉදිරිපත් කිරිම අනිවාර්ය වන අතර, එසේ ඉදිරිපත් නොකර අපහැදිලි පිටපත් හෝ රියදුරු බලපත්‍රය හෝ වෙනත් හදුනා ගැනිමේ ලේඛණ යොදා අයදුම් කරන අයදුම්පත් පෙර දැනුම්දිමකින් හා නැවත මුදල් ගෙවිමකින් තොරව ප්‍රතික්ෂේප කරන බව කරුණාවෙන් සලකන්න.

- අයදුම්පතට නිවැරදි තොරතුරු ලබා නොදිම, පැහැදිලි හා වලංගු ජාතික හැදුනුම්පත් හා විදේශ ගමන් බලපත් යොමු කර නොමැති වීම වැනි අඩුපාඩු සහිතව ඉදිරිපත් කරන අයදුම්පත් නැවත ගෙවීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

උදාහරණ : -  

ශ්‍රී ලාංකික පුරවැසිභාවය නොමැති විදේශිකයන් සඳහා හැඳුනුම්පත් අංකය හෝ එහි පිටපත් ඇතුලත් කිරීම අවශ්‍ය නොවේ.

මෙම නිෂ්කාසන අයදුම්පත්‍රයේ ප්‍රශ්න සඳහා තොරතුරු ඇතුලත් කිරීමේදී පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න. අයදුම්පත සම්පූර්ණයෙන්ම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ( විද්‍යුත් තැපැල් ලිපිනය හැර ) සම්පූර්ණ කරන්න . (EG :- BANDARA) තවද අයදුම්පත සම්පූර්ණ කිරීමේදී කිසිම අවස්ථාවක විශේෂිත සංකේත (“ “ # & $ ) භාවිතා නොකරන්න.

පොලිස් නිෂ්කාසන සහතිකයක් අයදුම් කිරීමේදී අයදුම්පතෙහි පළමු ප්‍රශ්නය Application type යනුවෙන් සඳහන් කර ඇත.

- එහිදී අයදුම්කරුට “New” සහ “Renewal” ලෙස විකල්ප දෙකක් ලබා දී ඇත.
- ප්‍රථම වතාවට ශ්‍රී ලංකා පොලිස් නිෂ්කාසන සහතිකයක් අයදුම් කරන අවස්ථාවේදී, කලින් අයදුම්කර නිවැරදි තොරතුරු ඇතුලත් නොකිරීම හේතුවෙන් දෝෂ සහිත සහතික පතක් ලද අවස්ථාවක (උදා - ජාතික හැඳුනුම්පත් අංකය වෙනුවට විදේශ ගමන් බලපත් අංකය ඇතුලත් කිරීමට, ජාතික හැඳුනුම්පතෙහි නම වෙනුවට විදේශ ගමන් බලපත්‍රයේ නම ඇතුලත් කර ගැනීමට, වර්ථමාන ලිපිනය වෙනස් කර ගැනීමට, සහතිකපත නිකුත් කර ඇති කාලසීමාව දීර්ඝ කර ගැනීමට හෝ යම් කාලසීමාවක් ඉවත් කර ගැනීමට, නව ජාතික හැඳුනුම්පත් අංකය හෝ නව විදේශ ගමන් බලපත්‍ර අංකය ඇතුලත් කර ගැනීමට, ජාතික හැඳුනුම්පතෙහි හෝ විදේශ ගමන් බලපත්‍රයේ නම, ලිපිනය හෝ වෙනත් තොරතුරු සංශෝධනය කරගත් අවස්ථාවක එම තොරතුරු ඇතුලත් කර ගැනීමට) යන අවස්ථා වලදී “New” විකල්පය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කල යුතුය.


- “Renewal” යන විකල්පය තෝරාගත් විට වසරක් ඇතුලත අවසන් වරට ලබාගත් සහතික පතක පිටපතක් පමණක් ලබාගත හැකි අතර එම අයදුම්පතෙහි තානාපති ලිපිනය හැර වෙනත් කිසිදු වෙනස් කමක් සිදු කිරීමට නොහැක.

ජාතික හැඳුනුම්පතෙහි සහ විදෙස්ගමන් බලපත්‍රයෙහි සඳහන් නම් ඒ ආකාරයෙන්ම සඳහන් කල යුතුය. [ඉංග්‍රිසි අකුරු ඒ ආකාරයෙන්ම නිවැරදිව ඇතුලත් කිරීමට වග බලාගත යුතු අතර අක්ෂර නිවැරදිව ඇතුලත් නොකිරීම (Spelling Mistake) සම්බන්ධව නිෂ්කාශන අංශය කිසිදු වගකීමක් දරණු නොලැබේ. ]

<u>**මාර්ගස්ථ (online) ක්‍රමය යටතේ නිෂ්කාසන අයදුම්පත සම්පූර්ණ කිරීම**</u>

අයදුම්පත්‍ර පෝරමයේ තොරතුරු ඉදිරිපත් කිරීමේදී පහත සඳහන් උපදෙස් පරිදි සම්පූර්ණ කරන්න **මෙහි රතු පැහැති තරු සලකුණක් දමා ඇති තොරතුරු ඔබ විසින් අනිවාර්යයෙන්ම ඇතුලත් කල යුතු අතර එවා ඉතා නිවැරදිව ඇතුලත් කල යුතුය.**

- නව අයදුම්පතක් යොමු කිරීමට අවශය නම් New Application ද අනු පිටපතක් අවශ්‍ය නම් Renewal යන්න තෝරා ගන්න. (New සහ Renewal සහතිකපත් වල වෙනස පෙර උපදෙස් වල ලබා දී ඇත.



Renewal යන විකල්පය තෝරාගත් විට පහත පරිදි අයදුම්පත සම්පූර්ණ කිරීමට කටයුතු කරන්න

Previous Application Reference No. 198254/2023/N Load

---

වසරක් ඇතුලත ලබාගත් සහතිකපතේ මාගේ අංකය යනුවෙන් ඇති අංකය ඇතුලත් කර (Load) යන්න Click කරන්න.

*Country: Romania

Reference high commission/ embassy/consulate: EMBASSY OF ROMANIA - COLOMB

ඉන් පසු ඔබට වෙනස් කිරීමට අවශ්‍ය රට හා තානාපති කාර්යාල නාමය වෙනස් කරන්න.

*I declare that the information provided above are true to the best of my knowledge and I agree to the terms of Sri Lankan Police Headquarters.

ඔබ ලබා දී ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි තොරතුරු බවට පිළිගෙන ඉහත සදහන් වාක්‍යට ඉදිරිපත් කර ඇති හිස් කොටුව Click කරන්න. ඉන් පසු ඔබව ගෙවීම් කිරීමේ පියවර සදහා යොමු කරනු ඇත.

New යන විකල්පය තෝරාගත් විට පහත පරිදි අයදුම්පත සම්පූර්ණ කිරීමට කටයුතු කරන්න

අයදුම්පත සම්පූර්ණ කිරීමේදි වඩාත් සැලකිලිමත්විය යුතු කරුණු සම්බන්ධයෙන් පහත උපදෙස් පරිදි ක්‍රියා කරන්න.

* Did you leave Sri Lanka before the age 16 ? No

ඉහත සදහන් කරුණ සම්බන්ධයෙන් "YES" යන්න සදහන් කල යුත්තේ වයස අවුරුදු 16 පෙර ස්ථිරවම ශ්‍රී ලංකාවෙන් පිටත්ව ගිය ශ්‍රී ලාංකික අයදුම්කරුවන් පමණි. එවැනි අයදුම්කරුවන් දැනට ශ්‍රී ලාංකික ජාතික හැදුනුම්පත ලබා නොමැති බැවින්, තමා ජිවත් වන රටේ ශ්‍රී ලාංකික තානාපති කාර්යාලය හරහා අයදුම්පත් ඉදිරිපත් කිරිමට කටයුතු කරන්න. එහිදි නිෂ්කාශන සහතික පත නිකුත්කල හැක්කේ උපන්දා සිට ශ්‍රී ලංකාව ස්ථිවම හැර ගිය දිනය දක්වා පමණි.

NIC No:

*Passport No:

Confirm NIC No:

*Confirm Passport No:


New NIC No:

*Country:


Please select

Confirm New NIC No:


- **NIC No :** අංක නවයකින් සහ V හෝ  X අක්ෂරය ඇතුලත් පැරණි ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කරන්න.
- **Confirm NIC No :** නැවත  අංක නවයකින් සහ V හෝ  X අක්ෂරය ඇතුලත් පැරණි ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කරන්න.
- **New NIC No :** නව අංක දොලහකින් යුත් ජාතික හැඳුනුම්පතක් ඇත්නම් එම අංකය ඇතුළත් කරන්න.
- **Confirm New NIC No :** නැවත අංක දොලහකින් යුත් නව ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කරන්න.
- ***Passport No :** විදේශ ගමන් බලපත්‍ර අංකය ඇතුළත් කරන්න.
- ***Confirm Passport No :** නැවත විදේශ ගමන් බලපත්‍ර අංකය ඇතුළත් කරන්න.
- ***Country -** නිෂ්කාසන සහතිකපත ඉදිරිපත් කිරීමට අවශ්‍ය වන රට තෝරන්න.




- **Reference high commission/embassy/consulate** -Country යටතේ අවශ්‍ය රට තෝරාගත් විට මෙ යටතේ ලැබෙන high commission/embassy/consulate අතුරින් අවශ්‍ය ලිපිනය තෝරන්න. (උදාහරණයක් වශයෙන් ලංකාවේ ඇති රුමේනියා තානාපති කාර්යාලය සඳහන් විය යුතුනම් embassy of Romania – Colombo යන්න තෝරන්න.) මෙය නිවැරදිව ඇතුලත් වී ඇත්නම් ඊට පහලින් ඇති කොටස් දෙකට ස්වයංක්‍රීයව ලිපිනය ඇතුලත් වේ. අවශ්‍යය ලිපිනය තොරා ගැනීමේ ලැයිස්තුවේ (Drop Down) නොමැතිනම් other යන්න තෝරා ඊට පහලින් ඇති ***High Commission/Embassy/Consulate Name (Addressee & the Name of the Authority):*** සහ ****Indicate address of the High Commission/Embassy/Consulate to which the certificate should be addressed to*** යන දෙකෙහි ලිපිනය නිවැරදිව type කල යුතුයි.




- ***Sex -** ස්ත්‍රී පුරුෂ භාවය ඇතුළත් කරන්න. (Male යන්න තේරූ විට සහතිකයේ නමට ඉදිරියෙන් Mr. ලෙස සහ Female යන්න තේරූ විට සහතිකයේ නමට ඉදිරියෙන් Ms. ලෙස මුද්‍රණය වන බැවින්, මේ සම්බන්ධයෙන් ඉතාමත් සැලකිලිමත් විය යුතුය)
- ***Status -** විවාහක, අවිවාහක, පූජ්‍ය යන්න අතුරින් අදාල කාණ්ඩය නිවැරදිව තෝරන්න. (Rev. යන්න තේරූ විට නමට ඉදිරියෙන් Rev. ලෙස මුද්‍රණය වේ)



- **Applicant's Name in full as in the NIC** -ජාතික හැඳුනුම්පත්‍රයේ සඳහන් නම ඒ ආකාරයෙන්ම නිවැරදිව ඇතුලත් කරන්න.

- **Applicant's Name in full as in the Passport** - විදේශ ගමන් බලපත්‍රයේ සඳහන් නම ඒ ආකාරයෙන්ම නිවැරදිව ඇතුළත් කරන්න. යම් හෙයිකින් වෙනස් වීම් හා නිරීක්ෂණ ( Alterations And Observations ) පිටුවේ නම වෙනස් කර ඇත්නම් එසේ වෙනස් කල නම ඇතුලත් කිරිමට කටයුතු කරන්න.

*Which name should be printed in certificate ? :

Select One

Select One
NIC
Passport

- **Which name Should be printed in certificate** යනුවෙන් සඳහන් කර ඇති ප්‍රශ්නය සඳහා "NIC" සහ "passport" යනුවෙන් විකල්ප දෙකක් ලබා දී ඇත.

  - "NIC" යන විකල්පය තෝරාගත් විට සහතික පතෙහි මුද්‍රණය වන්නේ ජාතික හැඳුනුම්පතෙහි අංකය සහ එහි සඳහන් නම වේ.

  - "Passport" යන විකල්පය තෝරාගත් විට සහතිකපතෙහි මුද්‍රණය වන්නේ විදේශ ගමන් බලපත්‍ර අංකය සහ එහි සඳහන් නම වේ. මෙහිදී අයදුම්කරුගේ විදේශ ගමන් බලපත්‍රයේ නම සහ ජාතික හැඳුනුම්පතේ නම අතර වෙනසක් පවතින්නේ නම් පමණක් ඒ සඳහා නීතීඥවරයෙකු හෝ සාමදාන විනිසුරු වරයෙකු විසින් සහතික කරන ලද දිවුරුම් ප්‍රකාශයක මුල් පිටපතක් උඩු ගත කල යුතුය. (නම් අතර වෙනසක් නොමැති විට දිවුරුම් ප්‍රකාශය වෙනුවට විදේශ ගමන් බලපත්‍රය ඇතුලත් කිරිම ප්‍රමාණවත්ය)

- ***Address:**
- ***Police Area:**
- ***From:**
- ***To:**

නිෂ්කාසන සහතිකපත අවශ්‍යය කාල සීමාවන්ට අදාල ලිපිනයන් සහ කාල සීමාවන් මෙහිදී ඇතුළත් කල යුතුය. ලිපිනයන් කිහිපයක පදිංචිව සිට ඇත්නම් එම ලිපිනයන්, ඊට අදාල පොලිස් වසම සහ එම ලිපිනයේ පදිංචිව සිටි කාල සීමාව වෙන් වෙන් වශයෙන් ඇතුලත් කල යුතුය. ඒ එක් එක් අවස්ථාවේදි ඊට අදාල පොලිස් වසම සහ එම ලිපිනයේ සිටි කාල සීමාව ඇතුලත් කිරීමෙන් පසු Add යන්න click කර නැවත ඊළඟ ලිපිනයට අදාල තොරතුරු ලබා දෙන්න .තොරතුරු ඇතුළත් කර අවසන් වන සෑම අවස්ථාවකදීම Add යන්න click කල යුතුය. Add යන්න click නොකලහොත් එම තොරතුර අයදුම්පතට ඇතුලත් නොවේ. ඇතුළත් කරන සෑම ලිපිනයකටම අදාල තොරතුරු Add යන්න click කළ පසු නිසි ආකාරයෙන් ඇතුළත් වී ඇත්නම් ඊට පහතින් ඇති වගුවට එම තොරතුරු ඇතුළත් වී ඇති ආකාරය දැකගත හැක) .මෙහිදී ඇතුළත් කර ඇති කාලසීමාවන් පමණක් සහතිකපතෙහි මුද්‍රණය වේ.

| Address | Police Area | From | To | Edit | Delete |
|---|---|---|---|---|---|
| 1 (ඔබේ ලිපිනය ඇතුලත් කරන්න) | Kelaniya | 16/01/1998 | 31/12/2002 | ✘ | ✘ |
| 2 (ඔබේ ලිපිනය ඇතුලත් කරන්න) | Alawwa | 01/01/2003 | 31/12/2013 | ✘ | ✘ |
| 3 (ඔබේ ලිපිනය ඇතුලත් කරන්න) | Rambukkana | 01/01/2014 | 09/08/2024 | ✘ | ✘ |

- **Are you referred applicant through the Sri Lankan Foreign Employment Bureau (SLBFE)? -** සහතික පත මුද්‍රණය වීමෙන් අනතුරුව එම සහතිකපත පොලිස් මූලස්ථානය හරහා විදේශ සේවා නියුක්ති කාර්යංශය වෙත බාර දීමට අවශ්‍යනම් "YES" යන්නද, අයදුම්කරුගේ නිවසට තැපැල් මගින් ගෙන්වා ගැනිමට අවශ්‍යනම් "NO" යන්නද ඇතුලත්

කරන්න. “YES” යන්න ඇතුලත් කරන්නේනම් විදේශ සේවා නියුක්ති කාර්යංශය විසින් පොලිස් නිෂ්කාශන සහතිකයක් ලබා ගැනිම සදහා නිකුත් කරන ලිපිය අදාල ස්ථානයට උඩු ගත කල යුතුය.

*Are you referred applicant through the Sri Lankan Foreign Employment Bureau(SLBFE)? No

*I declare that the information provided above are true to the best of my knowledge and I agree to the terms of Sri Lankan Police Headquarters.

ඔබ ලබා දි ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි තොරතුරු බවට පිළිගෙන ඉහත සදහන් වාක්‍යට ඉදිරිපත් කර ඇති හිස් කොටුව Click කරන්න. ඉන් පසු ඔබව ගෙවීම් කිරීමේ පියවර සදහා යොමු කරනු ඇත.

<u>**සැලකිය යුතුයි**</u>

I. අයදුම්පත විමර්ශනය කිරීමේ දී ප්‍රාදේශීය පොලිස් වාර්තා නිර්දේශ නොකිරීම හා ජාතික හැදුනුම්පත සම්බන්ධ ගැටලු ඇතිවුවහොත් දුරකථනය ඔස්සේ සම්බන්ධ කර ගනිමින් සහ විද්‍යුත් තැපැල් මඟින් අයදුම්කරු දැනුවත් කරන බැවින් නිවැරදි දුරකථන අංකයන් සහ නිවැරදි විද්‍යුත් තැපැල් ලිපිනයක් සඳහන් කල යුතුය.

II. පොලිස් නිශ්කාසන වාර්තාව ශ්‍රී ලංකා පොලිසිය විසින් ඔබ පිළිබඳව සිදු කරනු ලබන විමර්ශන මඟින් ලබා ගන්නා පසුබිම් වාර්තාව මත පදනම්ව පොලිස් මුලස්ථානයේ මුලස්ථාන පරිපාලන අධ්‍යක්ෂ විසින් නිකුත් කරනු ලබන අතර සහතිකපත් අයදුම්කරු සඳහන් කර ඇති ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් පමණක් යොමු කරන බව කරුණාවෙන් සලකන්න.

III. අයදුම්කරුගේ පුද්ගලික තොරතුරු ඇතුලත් කිරිමේදි “present Address in Sri Lanka” සඳහන්ව ඇති ස්ථානයේ වර්ථමාන ලිපිනය සඳහන් කිරිමේදි ලිපිනය අවසානයේ “Sri Lanka” යනුවෙන් අනිවාර්යෙන් සඳහන් කල යුතුය.

IV. පොලිස් , ත්‍රිවිධ හමුදා , සිවිල් ආරක්ෂක බලකාය, වෙරළ ආරක්ෂක බලකාය යන බලකායන් වල සක්‍රීය සේවයේ සිටින නිළධාරින් හට පොලිස් නිශ්කාසන වාර්තා නිකුත් කරනු ලබන්නේ බලයලත් නිලධාරීන්ගේ ලිඛිත අවසරය මත පමණි.

V. භාරදෙන ලද අයදුම්පත් සම්බන්ධයෙන් පසුවිපරම් කිරිමට අවශ්‍ය වූ විට පහත සඳහන් දුරකතන මඟින් විමසිම් කල හැකිය.

VI. අයදුම්පතෙහි යම් වෙනස්කමක් කිරිමට අවශ්‍ය නම් ඒ සඳහා අයදුම්පත ඉදිරිපත් කර දින දෙකක් ඇතුලත ඉල්ලීම් කල යුතු අතර ඉන් පසු සිදු කරනු ලබන ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

VII. නිශ්කාසන අයදුම්පතෙහි ඇතුලත් කර ඇති වැරදි තොරතුරු හා අසම්පූර්ණව අයදුම්පත් ඉදිරිපත් කර ඇති අවස්ථාවලදි එම අඩුපාඩුකම් නිවැරදි කරන ලෙසට දුරකථන, විද්‍යුත් තැපැල් හෝ වට්ස් ඇප් ( E-MAIL/ WhatsApp) මඟින් දැනුම් දි ඇති විටක එය මාස 03ක් ඇතුලත සම්පූර්ණ නොකල හොත් එම අයදුම්පත ජාලයෙන් ඉවත් කිරිමට කටයුතු කරනු ලැබේ.

VIII. අයදුම්පතෙහි පොලිස් වසමේ පදිංචි කාලය නිවැරදි ලෙස සඳහන් නොකරන අවස්ථාවලදි හා පොලිස් විමර්ශන මඟින් පදිංචිව සිටි කාලය අඩු වශයෙන් සඳහන් කර ඇති අවස්ථාවක විද්‍යුත් තැපැල් හෝ වට්ස් ඇප් ( E-MAIL/ WhatsApp) මගින් ඒ පිළිබඳව ඔබව දැනුවත් කරන අතර එවැනි අවස්ථාවලදී ද ඒ සඳහා නිවැරදි තොරතුරු ලබා නොදෙන්නේ නම් පොලිස් ස්ථාන මඟින් නිර්දේශ කරන කාල සීමාවට පමණක් නිශ්කාසන වාර්තා නිකුත් කිරීමට ක්‍රියා කරනු ලැබේ.


දුරකථන අංක - 0112439185, 0112439186, 0112122800

ෆැක්ස් අංක - 0112439187, 0112439188

වට්ස් ඇප් අංක - 071 8592990

ඊමේල් - clearance@police.gov.lk

වෙබ් ලිපිනය - www.police.gov.lk

ලිපිනය - 17 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.